# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2470/13 – 2026 ජනවාරි මස 05 වැනි සඳුදා – 2026.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1142, කිතලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිතලව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KPW/2021/662 සහ 2023.07.27 දිනැති පූගමණ අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර ‘A’ – නාගලන්වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.1518 ක් පමණ**

උතුරට: ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන නාගලන්වත්ත සහ සුනිල් අබේවර්ධන හිමිකම් කියන නාගලන්වත්ත; නැගෙනහිරට සහ දකුණට: කුලියාපිටිය ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාගලන්වත්ත, කැබලි අක්ෂර B සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන නාගලන්වත්ත; බටහිරට: ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන නාගලන්වත්ත.

02. කැබලි අක්ෂර ‘B’ – නාගලන්වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0215 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර A සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාගලන්වත්ත; නැගෙනහිරට: කුලියාපිටිය ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාගලන්වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන නාගලන්වත්ත; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන නාගලන්වත්ත සහ කැබලි අක්ෂර A.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/125.
2025 නොවැම්බර් මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0042



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*